**ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමණාකරණ ව්‍යාපෘතිය - 2023**

---

ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමණාකරණ ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2017 සැප්තැම්බර් 29 දින එළඹි අංක 5788 -එල්කේ දරණ ණය ගිවිසුමේ පොදු කොන්දේසිවල ඇතුළත් II බී (3) වගන්තිය සහ 4.09 (බී) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු යැයි සැලකෙන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුමට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ වත්කම් කළමනාකරණය පිළිබඳ මාර්ග සංවර්ධන අධිකාරියේ ධාරිතාව ශක්තිමත් කිරීම සහ සැලසුම්කරණය- ඉදිකිරීම- නඩත්තුව හා ක්‍රියාත්මක කිරීම යන කරුණු නිසි ක්‍රම වේදයකින් යුතුව භාවිතා කර නිමැවුම් සහ කාර්ය සාධනය පදනම් කරගත් කොන්ත්‍රාත් ක්‍රම භාවිතයෙන් සකසන ලද ආකෘතියක් (OPBRC) යටතේ පෑලියගොඩ- පුත්තලම මාර්ගයේ ජා-ඇල සිට හලාවත දක්වා කි.මී. 58 කින් යුත් (කොටසක්) නියමුකරණය කිරීමයි.සංවර්ධන ණය ගිවිසුම් අංක 5788 අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වි.ගැ.හි මිලියන 90.5 කට සමාන එ.ජ.ඩො මිලියන 125ක් හෙවත් රු.මිලියන 18,125 ක් වන අතර සම්පූර්ණ වටිනාකම මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA) එකඟ වී තිබුණි. කෙසේ වෙතත්, 2018 අගෝස්තු 15 දිනැති අංක 18/1682/805/051 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, ව්‍යාපෘතියේ මූලික විෂය පථය වෙනස්කර තිබුණි. ඒ අනුව, මූලික ණය ප්‍රතිපාදනයෙන් රු. මිලියන 14,500 කට සමාන එ.ජ.ඩො මිලියන 100 ක් ව්‍යාපෘතියෙන් ඉවත්කර, සියළුම පළාත් මාර්ග වැඩිදියුණු කිරීම සඳහා පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශයට වෙන්කර දී තිබුණි. ඉතිරි ශේෂයෙන්, ව්‍යාපෘතියේ කටයුතු සිදුකිරීම සඳහා රු. මිලියන 2,320 කට සමාන එ.ජ.ඩො මිලියන 16 ක් වෙන්කර තිබූ අතර ඉතිරි මුදල වූ රු.මිලියන 1,232.5කට සමාන එ.ජ.ඩො මිලියන 8.5ක් මාර්ග නඩත්තු භාර අරමුදලට මාරුකර තිබුණි. කෙසේ වෙතත්, 2020 මැයි 06 දින ශ්‍රී ලංකා රජය විසින් කරන ලද ඉල්ලීමකට අනුව කොවිඩ් 19 වැඩපිළිවෙල සඳහා එ.ජ.ඩො මිලියන 7ක් මාරු කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා වෙන්කරන ලද මුළු ණය ප්‍රමාණය රු. මිලියන 1,305කට සමාන එ.ජ.ඩො මිලියන 9 ක් දක්වා නැවතත් අඩු කර තිබුණි.

ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජුනි 30 දින ආරම්භ කර 2018 අගෝස්තු 15 දින ප්‍රතිව්‍යුහගත කර තිබුණු අතර 2023 සැප්තැම්බර් 30 වන විට නිමකර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය හා කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිනුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | මුදල රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 10.91 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් අයකර ගැනීමට ඉතිරිව තිබුණද එය අයවූ ශේෂයක් ලෙස සඳහන් වීමෙන් රුපියල් මිලියන 10.91 ක ජංගම වත්කම් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ අඩුවෙන් දක්වා තිබුණි. | 10.91 | එකඟ වේ.<br><br>රුපියල් මිලියන 10,914,681.26 ක අයකර ගැනීමට තිබෙන වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් ජ'නල් සටහනක් මගින් නිවැරදි කර තිබුණි. | වත්මන් තත්ත්වය මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කළ යුතුය. |
| වත්කම් ආනයනය කිරීමෙන් පසු LC අත්තිකාරම් නිදහස් කිරීමට ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ජංගම නොවන වත්කම් රුපියල් මිලියන 155.29 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 155.29 | එකඟ වේ.<br><br>කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි අනුව, ගැනුම්කරු විසින් පිළිගැනීමේ සහතිකය නිකුත් කිරීමෙන් පසු නිකුත් කරන ලද LC හි ඉතිරි මුදල නිදහස් කරනු ලැබේ. | SLPSAS අංක 7 අනුව කටයුතු කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව භෞතික ප්‍රගතිය

**2023 දෙසැම්බර් 31 දිනට**

| | අපේක්ෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය | අත්කරගත් කාර්යසාධනය ප්‍රතිශතය | | |
|---|---|---|---|---|
| ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමණාකරන ව්‍යාපෘතියේ (TCAMP) අවසන් දිනය 2023 සැප්තැම්බර් 30 වුවත්, අපේක්ෂිත භෞතික කාර්යසාධනය සියයට 100 න් 2023 දෙසැම්බර් 31 දිනට අත්කරගත් කාර්යසාධනය සියයට 98.81 ක් වී තිබුණි. | 100 | 98.81 | ව්‍යාපෘති කාර්ය සාධනයට අහිතකර ලෙස බලපානු ලැබේ. | කොන්ත්‍රාත් අංක. LK-RDA-148668 NC-RFB යම් ආරවුලක් හේතුවෙන් 2023.12.31 වන විට සම්පූර්ණ කර නොමැත. |

**කළමනාකරණයේ ප්‍රතිචාර**

එකඟ වේ.
කොන්ත්‍රාත් අංක LK-RDA-148668 NC-RFB හැර සියලුම ව්‍යාපෘති ක්‍රියාකාරකම් කොන්ත්‍රාත් ගිවිසුම් අනුව 100% සම්පූර්ණ කර ඇත, එබැවින් 2023.12.31 දිනට සමස්ත භෞතික ප්‍රගතිය 98.81% විය.

**විගණකගේ නිර්දේශය**

වැඩ සැලැස්මට අනුව ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය.

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) | වත්කම් කළමනාකරණය සඳහා ආයතනික ශක්තිමත් කිරීම සහ ධාරිතා වර්ධනය යන කොටස් 2 ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වන අතර ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො. මිලියන 125 ක් හෙවත් රු. මිලියන 18,125 කට සමාන වි.ගැ.හි මිලියන 90.5 ක් විය. කෙසේ වෙතත්, 2018 අගෝස්තු 15 දිනැති අංක 18/1682/805/051 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, ව්‍යාපෘතියේ මූලික විෂය පථය වෙනස් කර තිබුණි. ඒ අනුව, මූලික ණය ප්‍රතිපාදනවලින් එ.ජ.ඩො. මිලියන 100 කට සමාන රු. මිලියන 14,500 ක් ව්‍යාපෘතියෙන් ඉවත් කර ඇති අතර එම මුදල සියලුම පළාත් මාර්ග වැඩිදියුණු කිරීම සඳහා පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශයට වෙන් කර තිබුණි. ඉතිරි ශේෂයෙන් ව්‍යාපෘතියේ කටයුතු කරගෙන යාමට වෙන් කර තිබුණේ එ.ජ.ඩො. මිලියන 16කට සමාන රුපියල් මිලියන 2,320ක මුදලක් පමණක් වන අතර ඉතිරි මුදල රුපියල් මිලියන 1,232.5ට සමාන ඇමෙරිකානු ඩොලර් මිලියන 8.5ක් මාර්ග නඩත්තු භාර අරමුදල වෙත පවරා තිබුණි. කෙසේ වෙතත්, 2020 මැයි 6 වන දින ශ්‍රී ලංකා රජය විසින් කරන ලද ඉල්ලීම පරිදි COVID 19 සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 7 ක් පැවරීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා වන මුළු ණය ප්‍රතිපාදන නැවත ඇමරිකානු ඩොලර් මිලියන 9 ට සමාන රුපියල් මිලියන 1,305 දක්වා අඩු කර ඇත. අවසානයේ ඇමරිකානු ඩොලර් මිලියන 7කට සමාන රුපියල් මිලියන 2,086 ක මුදලක් වෙන්කර තිබු අතර, රටේ පවතින ආර්ථික අර්බුදයට සහායවීම සඳහා ඉතිරි මුදල ඇමරිකානු ඩොලර් මිලියන 2 ක් මාරු කර ඇත. ව්‍යාපෘතිය 2016 ජුනි 30 දින එහි කටයුතු ආරම්භ කර 2018 අගෝස්තු 15 දින ප්‍රතිව්‍යුහගත කර 2023 සැප්තැම්බර් 30 වන විට අවසන් කර තිබුණි. තවද, ණය අරමුදල සීමා කිරීම හේතුවෙන් ආයතනික හා පාලන ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවද නිරීක්ෂණය විය. | එකඟ වේ. | වැඩ සැලැස්මට අනුව ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ණය මුදලෙන් කොටසක් උපදේශන නොවන සේවා කොන්ත්‍රාත්තුවේ පිරිවැය ගෙවීම සඳහා භාවිතා කර ඇති අතර කොන්ත්‍රාත් මුදල රුපියල් මිලියන 190.77 ක් වූ අතර එය 2021 ජුනි 24 දින ආරම්භ කර 2023 පෙබරවාරි 23 දින සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, මුල් වැඩසටහනට අනුව 2023 දෙසැම්බර් 31 වන විට වාර්තා වී ඇත්තේ සියයට 85ක භෞතික ප්‍රගතියක් පමණි. | එකඟ වේ. | වැඩ සැලැස්මට අනුව ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කොන්ත්‍රාත්තුව ආරම්භයේදී හඳුනා නොගෙන, විචලා නියෝග යටතේ අතිරේක කාර්යයන් හඳුනා ගැනීම හේතුවෙන්, උපදේශන කාර්යයේ මූලික විෂය පථය වෙනස් වී ඇති බව නිරීක්ෂණය වූ අතර, කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන අත්පොතේ 14 වන අතිරේකයට අනුව අනුමැතිය ලබා නොගෙන කොන්ත්‍රාත් පැකේජයේ මුළු පිරිවැයෙන් සියයට 17.79 ක් නියෝජනය කරමින් රුපියල් මිලියන 29.23 ක් දක්වා විචලා එකතු කිරීමක් සිදු කර තිබුණි. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් අංක 4,5 විචල තා නියෝග සඳහා ලබා දුන් අනුමැතිය ඉවත් කරගෙන තිබුණු අතර එම කාර්යය සේවා සපයන්නාගේ විෂය පථය යටතේ සිදු කරන ලෙසට දන්වා තිබුණි | ආරම්භක අදියරේදී කාර්යයේ නිවැරදි විෂය පථය හඳුනා ගැනීම අවශ්‍ය වේ. |
| (ඈ) | කොන්ත්‍රාත් ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසිවල (GCC) 3.1 වගන්තියට අනුව, සේවා සපයන්නා විසින් පිරිවිතරයන් සහ සේවා විස්තරයට අනුකූලව සේවාවන් ඉටු කළ යුතුය. රුපියල් මිලියන 161ක මුදලක් ගෙවා තිබුණද එම උපදේශන වාර්තාව අධිවේගී මාර්ග ජ්‍යාමිතික සැලසුම් කටයුතු සඳහා යොදා ගැනීමට නොහැකි තත්වයේ පවතින බව නිරීක්ෂණය වූ අතර. කොන්ත්‍රාත් ගිවිසුමට අනුව වාර්තා ලබා නොගෙන ගෙවීම් නිකුත් කිරීම විගණනයේ දී ගැටලුකාරී විය. | එකඟ වේ. | කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි අනුව අවසන් වාර්තාව සම්පූර්ණ කිරීමට උපදෙස් දිය යුතුය. |
| (ඉ) | කොන්ත්‍රාත්තුවේ අරමුණ මාර්ග වෙන්කිරීම් සහ ජලාපවහන සිතියම් සකස් කිරීම සහ බස්නාහිර, වයඹ සහ සබරගමුව පළාත්වල ජාතික ජීඅයිඑස් ආකෘතියේ පවතින ජලාපවහන පද්ධති සහ අවශ්‍ය ජලාපවහන වැඩිදියුණු කිරීම් හඳුනාගැනීම පිළිබඳ තොරතුරු රැස්කිරීම වුවද. විචලතා නියෝග අංක 01,02,03 සහ 06 මගින් කොන්ත්‍රාත්තුවේ විෂය පථයට අයත් නොවන රියදුරු වැටුප් ගෙවීමට සහ ද්විත්ව කැබ් රථයක් ලබාදීම සඳහා රුපියල් මිලියන 10.79ක වියදමක් දරා ඇති බව නිරීක්ෂණය විය. | එකඟ වේ. | ව්‍යාපෘතියේ විෂය පථය තුළ ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය |
| (ඊ) | සේවා සපයන්නාගේ කාර්ය සාධනය ඉතා දුර්වල වුවද, කොන්ත්‍රාත් ගිවිසුමේ විශේෂ කොන්දේසි 3.8.1 වගන්තිය අනුව කොන්ත්‍රාත්කරු වෙතින් ඇවර කිරීමේ හානිය අඩු කිරීමට ව්‍යාපෘතිය විසින් ක්‍රියා කළ යුතු වුවත්. ප්‍රමාද හානි රුපියල් මිලියන 9.5 ක් ED & PMC සමාගම වෙතින් අඩු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | මෙම කොන්ත්‍රාත්තුවට අදාළ ආරවුල් විසඳීම සඳහා විනිශ්චය මණ්ඩලය (DAB) පත් කර ඇති අතර ක්‍රියාවට නංවමින් පවතී. මීළඟ ගෙවීමේදී ප්‍රමාද හානි අඩු කිරීමට සලකා බලනු ලැබේ. | කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසිය අනුව ප්‍රමාද හානි අඩු කිරීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (උ) | Arial ට්‍රක් රථය සැපයීම සඳහා වූ ගෙවීමෙන් රුපියල් මිලියන 5 ක ද්‍රවශීල හානි අයකර ගෙන තිබුණු අතර, 2023 දෙසැම්බර් 31 දිනට එම රුපියල් මිලියන 5 ක ද්‍රවශීල හානි ණයහිමි පාලන ගිණුමේ සඳහන් කර වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ සටහන් කර ඇති බව නිරීක්ෂණය විය. | හේතුන් කිහිපයක් නිසා වාහනයට එකඟ වූ පරිදි අමතර කොටස් සැපයීමට නොහැකි වූ බව සැපයුම්කරු දන්වා තිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි අනුව ප්‍රමාද හානි ඉල්ලා සිටීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. |